# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.25 පැය 0950 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1941 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන පෙරහර වීථි සංචාරය කිරීම හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම - ගිරිඋල්ල පොලිස් වසම.

ගිරිඋල්ල පොලිස් වසමේ **ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ වාර්ෂික පෙරහර** අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇති අතර මෙම පෙරහර නැරඹීම සඳහා විශාල බැතිමතුන් පිරිසක් පැමිණෙනැයි අපේක්ෂා කරනු ලබයි. පෙරහර 2025.10.25 වන අද දින රාත්‍රී 0800 සිට පසුදින අළුයම දක්වා ගිරිඋල්ල නගරය ආශ්‍රිතව කුරුණෑගල මීගමුව ප්‍රධාන මාර්ගයේ වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව, මෙම පෙරහර **ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයෙන්** ආරම්භ වී ගිරිඋල්ල නගරය ආවරණය වන පරිදි වීථි සංචාරය කිරීම හේතුවෙන් කුරුණෑගල කොළඹ 05 මාර්ගය සහ කුරුණෑගල මීගමුව මාර්ගයේ නගර ප්‍රදේශය තුල වාහන තදබදයක් ඇති විය හැකි බැවින් එම මාර්ගය භාවිතා කර නගරය හරහා ගමන් කරන රියදුරන් හා මහජනතාව වෙත පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් ඉල්ලා සිටියි.

**භාවිතා කල හැකි විකල්ප මාර්ග :-**

- ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට කොළඹ 05 මාර්ගය භාවිතා කිරීමට පැමිණෙන සියළුම බර වාහන දම්පැලැස්ස හන්දියෙන් අලව්ව මාර්ගයට අවතීර්ණ විය හැකිය.
- ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට 05 මාර්ගය භාවිතා කිරීමට පැමිණෙන සියළුම සැහැල්ලු වාහන මාහරගම හන්දියෙන් ඇතුල්කර අලව්ව මාර්ගයට අවතීර්ණ විය හැකිය.
- මීගමුව නාරම්මල මාර්ගයේ ගිරිඋල්ල පාලම හරහා කොළඹ 05 මාර්ගයට සහ මීරිගමට පිවිසෙන සියළු වාහන මැල්ලවලාන හන්දිය හරහා පිහිටා ඇති කොටදෙණියාව පාර ඔස්සේ කොළඹ 05 ප්‍රධාන මාර්ගයට අවතීර්ණ විය හැකිය.
- පන්නල සිට ගිරිඋල්ල හරහා කුරුණෑගල දෙසට ධාවනය වන වාහන කැලණියමුල්ල හන්දිය හරහා හමන්ගල්ල ප්‍රදේශයෙන් කරුණෑගල ප්‍රධාන මාර්ගයට අවතීර්ණ විය හැකිය. (නාරම්මල දෙස සිට මීගමුව දෙසට ගමන් ගන්නා සියලු වාහන සඳහා ද මෙම මාර්ගය භාවිත කල හැකිය).
- අත්‍යාවශ්‍ය සේවා සපයන ගිලන් රථ සහ මගී ප්‍රවාහන බස් රථ සඳහා පමණක් නගරය හරහා ගමන් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය